# විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

## මාධ්‍ය නිවේදනය

### B2B Luxury Connect 2026 හිදී ශ්‍රී ලංකාව සිය බුටික් (Boutique) සුඛෝපභෝගී සංචාරක කර්මාන්තය ලොවට විදහා දක්වයි

කොළඹ, ශ්‍රී ලංකාව – 2026 අප්‍රේල් 28

ශ්‍රී ජයවර්ධනපුර මොනාක් ඉම්පීරියල් (Monarch Imperial) හිදී පැවැත්වුණු B2B Luxury Connect Sri Lanka 2026 හිදී, බුටික් සහ සුඛෝපභෝගී සංචාරක ව්‍යාපාරයේ ප්‍රමුඛතම ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව සතු ස්ථානය යළිත් තහවුරු විය. 'Boutiques in Sri Lanka' ආයතනය විසින් පිට පිට හත්වන වරටත් සංවිධානය කරන ලද මෙම අවස්ථාව සඳහා බුටික් හෝටල් පරිශ්‍ර 300 කට අධික සංඛ්‍යාවක් මෙන්ම ජාත්‍යන්තර සංචාරක නියෝජිතයින්, හෝටල් හිමියන් සහ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් රැසක් සහභාගී වූහ.

මෙහි ප්‍රධාන දේශනය පවත්වමින් සංචාරක නියෝජ්‍ය අමාත්‍ය මහාචාර්ය රුවන් රණසිංහ මහතා අවධාරණය කළේ, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ අනාගතය හැඩගැස්වීමේදී බුටික් සහ සුඛෝපභෝගී අංශය ඉතා වැදගත් වන බවයි. මෙම අංශය හුදෙක් සුවිශේෂීත්වය සහ ආකර්ෂණය පමණක් නොව, ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන ඉහළ ආදායම් ලබන (High-yield) සංචාරකයින් ද මෙරටට ආකර්ෂණය කර ගන්නා බව ඔහු සඳහන් කළේය.

"ශ්‍රී ලංකාව යනු පිරිසිදු වෙරළ තීරයන්, සරුසාර හූ දශර්න, පොහොසත් සංස්කෘතික උරුමයන් සහ සියල්ලටත් වඩා අපේ මිනිසුන්ගේ උණුසුම් ආගන්තුක සත්කාරයෙන් ආශීර්වාද ලැබූ දේශයක්. නමුත් අද පවතින තරඟකාරී ගෝලීය සංචාරක වෙළඳපොළ තුළ අපව සැබවින්ම කැපී පෙනෙන්නේ සත්‍ය ගවේෂී, පුද්ගලාරෝපිත සහ ඉහළ වටිනාකමකින් යුත් අත්දැකීම් ලබා දීමට අපට ඇති හැකියාවයි. බුටික් සහ සුඛෝපභෝගී අංශයෙන් නිරූපණය වන්නේ එයයි; එය ලොව වේගයෙන්ම වර්ධනය වන කාණ්ඩය වීමට හේතුව ද එයයි," යැයි නියෝජ්‍ය අමාත්‍ය රණසිංහ මහතා පැවසීය.

තිරසාර, ප්‍රජා මූලික සහ ගෝලීය වශයෙන් තරඟකාරී සංචාරක කර්මාන්තයක් ගොඩනැගීමේ රජයේ දැක්ම පැහැදිලි කළ නියෝජ්‍ය අමාත්‍යවරයා, එම ඉලක්කය සපුරා ගැනීම සඳහා බුටික් සහ සුඛෝපභෝගී ආගන්තුක සත්කාරය අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරන බව අවධාරණය කළේය. ශ්‍රී ලංකාවේ බුටික් හෝටල් සහ ජාත්‍යන්තර සංචාරක ක්‍රියාකරුවන් අතර සබඳතා ගොඩනැගීමටත්, ඒ හරහා ගෝලීය දෘශ්‍යතාව සහ දිගුකාලීන හවුල්කාරිත්වයන් සහතික කිරීමටත් වේදිකාවක් නිර්මාණය කිරීම පිළිබඳව ඔහු සංවිධායකයින්ට ප්‍රශංසා කළේය.

මෙවර උත්සවය ශ්‍රී ලාංකීය සංස්කෘතික අනන්‍යතාවයෙන් ඔපවත් වූ අතර, සාම්ප්‍රදායික ආහාර පාන සහ විනෝදාස්වාද අංග රැසක් වැඩසටහනට ඇතුළත් විය. එම පරිසරය දිවයිනේ උරුමය පිළිඹිබු කරන අතරම නූතන ආගන්තුක සත්කාරයේ ප්‍රමිතීන් ද ප්‍රදශර්නය කළේය. ක්ෂේත්‍රයේ වෘත්තිකයන්, හෝටල් හිමියන් සහ සංචාරක පාශර්වකරුවන් රැසකගේ සහභාගීත්වය මෙම අවස්ථාව සහයෝගීතාවයේ සහ නවෝත්පාදනයේ කේන්ද්‍රස්ථානයක් ලෙස තහවුරු කිරීමට ඉවහල් විය.

එංගලන්තය, බෙල්ජියම, ඩුබායි, රුසියාව සහ ඇමරිකා එක්සත් ජනපදය ඇතුළු රටවල් කිහිපයක සංචාරක නියෝජිතයින්ගේ සහභාගීත්වය හරහා ශ්‍රී ලංකාවේ සුඛෝපභෝගී සංචාරක ක්ෂේත්‍රය කෙරෙහි පවතින ජාත්‍යන්තර විශ්වාසය මැනවින් විදහා දැක්විණි.

සංචාරක ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලෙස ඔහු කර්මාන්තකරුවන්ගෙන් ඉල්ලා සිටියේය:

ගෝලීය අපේක්ෂාවන් සපුරාලීම සඳහා සේවා ප්‍රමිතීන් ඉහළ නැංවීම.

පරිසරය සුරකින තිරසාර සංචාරක භාවිතයන් ප්‍රවර්ධනය කිරීම.

ස්ථාවරත්වය සහ වර්ධනය සඳහා ජාත්‍යන්තර හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීම.

ශ්‍රී ලංකාවේ සැබෑ කතාව — උරුමය, ආගන්තුක සත්කාරය සහ නවෝත්පාදනය පිළිබඳ කතාව ලොවට පැවසීම.

සිය කතාව අවසන් කරමින් නියෝජ්‍ය අමාත්‍ය රණසිංහ මහතා ශ්‍රී ලංකාවේ බුටික් අංශයේ ඔරොත්තු දීමේ හැකියාව සහ නිර්මාණශීලිත්වය අගය කළ අතර, සුඛෝපභෝගී සහ සත්‍ය ගවේෂී සංචාරක ගමනාන්තයක් ලෙස මෙරට කීර්තිය ඉහළ නංවන මුලපිරීම් සඳහා රජයේ සහාය නැවතත් තහවුරු කළේය.

B2B Luxury Connect Sri Lanka 2026, බුටික් හෝටල් හිමියන් ජාත්‍යන්තර ගැනුම්කරුවන් සමඟ සම්බන්ධ කරමින්, ශ්‍රී ලංකාව නැගී එන ගෝලීය සුඛෝපභෝගී සංචාරක මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපිත කිරීමට අඛණ්ඩව දායක වේ.

**මාධ්‍ය ඒකකය,**

**නිකුත් කළ දිනය: 2026/04/30** **යොමු අංකය: MOT/DMO/PR/M2**